**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

## අදියර I විභාගය - 2024 ජනවාරි

# (103) ආර්ථික විද්‍යාව

(Economics)

---

ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය සඳහා උත්තර සැපයීමේදී බොහෝ විභාග අයදුම්කරුවන් ප්‍රමාණාත්මක මට්ටමින් උත්තර සපයා තිබූ බව පෙනේ. කෙසේවෙතත්, සමස්තයක් වශයෙන් ගත් කළ ඇතැම් ප්‍රශ්න සඳහා බොහෝ අයදුම්කරුවන් සපයා තිබූ උත්තරවල යම් යම් අඩුපාඩුකම් දක්නට ලැබුණි.

ඒ අනුව උත්තරපත් පරීක්ෂා කිරීමේදී ඒ පිළිබඳව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයන් පහත දැක්වේ:

## A කොටස

### ප්‍රශ්න අංක 01

මුළු විෂය නිර්දේශයම ආවරණය වන අයුරින් මෙම **A කොටස** සමන්විත වී තිබේ. ප්‍රශ්න අංක **1.1** සිට **1.10** දක්වා දෙන ලද වරණ වලින් නිවැරදි වරණය තේරීමත්, ප්‍රශ්න අංක **1.11** සිට **1.12** දක්වා දී ඇති පිළිතුරු අතුරින් නිවැරදි උත්තරය තේරීමත් **1.13 - 1.14** දක්වා ප්‍රශ්නවලට එක් එක් ප්‍රකාශය සත්‍ය හෝ අසත්‍ය බව ප්‍රකාශ කිරීමත් **1.15 – 1.20** දක්වා ප්‍රශ්න වලට, පිළිතුරු ලිවීමත් මෙම කොටස මගින් අපේක්ෂා කෙරේ.

මෙම ප්‍රශ්නය යටතේ බොහෝ අයදුම්කරුවන් සාර්ථක ලෙස ලකුණු ලබාගෙන තිබූ අතර සමහර අයදුම්කරුවන්ගේ උත්තරවල දුර්වලතා තිබුණි. මේ අනුව පොදුවේ දැකිය හැකි දුර්වලතා පහත පරිදි වේ.

**1.1** හිඟකම යන සංකල්පය පිළිබඳව අසා ඇති මෙම ප්‍රශ්නයට, අසීමිත මිනිස් වුවමනාවන්ට සාපේක්ෂව සම්පත්වල ඇති සීමිත බව ලෙස බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

**1.2** සාර්ව ආර්ථික විද්‍යාව මගින් ආවරණය නොවන ක්ෂේත්‍රයක් ලෙෂ "වෙළඳපොළ තුළ පාරිභෝගික හැසිරීම" නිවැරදිව හඳුනාගෙන තිබුණි.

**1.3** බොහෝ අයදුම්කරුවන් "සැපයුම වෙනස්වීම" යන්නට නිවැරදි පිළිතුර ලෙස භාණ්ඩයේ මිල ස්ථාවරව පවතින අතර, සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක වෙනස් වන බවට නිවැරදිව හඳුනාගෙන ඇත.

එහෙත් සමහර අයදුම්කරුවන් සංකල්පය පටලවාගෙන භාණ්ඩයේ මිල වෙනස්වන අතර, සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නෙවෙනස්ව පවතින බවට වැරදි සහගත ලෙස පිළිතුරු සපයා තිබුණි.

**1.4** බොහෝ අයදුම්කරුවන් රූප සටහනේ ලකුණු කර ඇති **X** ලක්ෂ්‍ය මගින් පූර්ණ සේවා නියුක්තිය නිරූපණය කරන බව නිවැරදිව හඳුනාගෙන තිබුණි.

**1.5** අයදුම්කරුවන් බොහෝ දෙනෙකුට උපයෝගීතා න්‍යාය පිළිබඳ දැනුම මඳ බව පෙනේ. උපයෝගිතා න්‍යාය පිළිබඳ අසා තිබූ මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා නොමැත.

1.6 භාණ්ඩයක මිල ඉල්ලුම් නම්‍යතාව පිළිබඳව අසා තිබූ ප්‍රශ්නයට ගණනය කිරීමෙන් පසු ලැබෙන පිළිතුර 1 ට අඩු අගයක් බැවින් සාර්ථක ලෙස අනම්‍ය ඉල්ලූමක් යන්න තීරණය කර ඇත.

1.7 2022 මහ බැංකු වාර්තාවට අනුව ඒක පුද්ගල ආදායම පිළිබඳව අසා තිබූ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා නොමැත. මහ බැංකු වාර්තාව පරිශීලනය කිරීමට අයදුම්කරුවන්ගේ අඩු අවධානයක් ඇති බව පෙනේ.

1.8 පාරිභෝගික අතිරික්තය ගණනය කිරීමට දී ඇති මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් නිවැරදිව ගණනය කර තිබුණි.

1.9 පූර්ණ තරගකාරී ආයතනයක සමතුලිතතාවය පිළිබඳව මිල, සාමාන්‍ය පිරිවැයට සමාන වන විට ප්‍රාමාණික ලාභ ලබන බව බොහෝ අයදුම්කරුවන් හඳුනාගෙන තිබුණි.

1.10 ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තියේ ගුණාත්මක උපකරණයක් ලෙස, ණය සඳහා වන ඇප සුරැකුම්පත් මත සීමා පැනවීම යන්න බොහෝ අයදුම්කරුවන් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණි.

1.11 වෙළඳපොලේ මිල තනන්නෙකු ලෙස ක්‍රියාකරන්නේ ඒකාධිකාරී ආයතනයක් බව බොහෝ අයදුම්කරුවන් නිවැරදිව හඳුනාගෙන තිබුණි.

1.12 යෙදවුම් සමානුපාතික වැඩිවීම, නිමැවුමේ සමානුපාතික වැඩිවීමට වඩා අඩු වන විට අඩුවන පරිමානුකූල ඵල ඇතිවන බවට, සමහර අයදුම්කරුවන් වැරදි ලෙස නිගමනය කර ඇත.

1.13 රජය විසින් නිෂ්පාදකයින් මත ඒකක බද්දක් පැනවීමේ ප්‍රතිඵලයක් ලෙස සැපයුම් වක්‍රය දකුණට විතැන්වීම අසත්‍ය ප්‍රකාශයක් ලෙස බොහෝ අයදුම්කරුවන් නිවැරදිව නිගමනය කර ඇත.

1.14 නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන සියලුම යෙදවුම් සාධක දිගු කාලයේදී විචල්‍යය වන බව සත්‍ය ප්‍රකාශයක් ලෙස නිවැරදිව බොහෝ අයදුම්කරුවන් හඳුනාගෙන ඇත.

1.15 ආර්ථික වර්ධනය යන්න බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා ඇති අතර, සමහර අයදුම්කරුවන් පිළිතුරු සැපයුවද සමහර අයදුම්කරුවන් අසම්පූර්ණ ලෙස පිළිතුරු සපයා ඇත.

1.16 ඒකාධිකාරී තරගකාරී වෙළඳපොළක ලක්ෂණ බොහෝ අයදුම්කරුවන් නිවැරදිව ලියා තිබූ අතර සමහර අයදුම්කරුවන් ප්‍රශ්නය සම්පූර්ණයෙන් නොකියවා ඒකාධිකාරී වෙළඳපොළක ලක්ෂණ ලියා ඇත.

1.17 වාණිජ බැංකුවක කාර්යයන් ලෙස තැන්පතු භාරගැනීම හා ණයදීම යන කරුණු 2 අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් ඉදිරිපත් කර ඇත.

1.18 "සැපයුම් නීතිය" යන්න සුපයුම තිරණය වීම කෙරෙහි බලපාන මිල හැර සෙසු සාධක නොවෙනස්ව තිබියදි සලකා බලන භාණ්ඩයේ මිල හා සැපයුම් ප්‍රමාණය අතර පවත්නා අනුලෝම සම්බන්ධය ලෙස සාර්ථක ලෙස බොහෝ අයදුම්කරුවන් පිළිතුරු සපයා තිබුණද, සමහර අයදුම්කරුවන් මිල හැර සෙසු සාධක නොවෙනස් යන්න සඳහන් කර නොමැතිව පිළිතුරු සපයා ඇත

1.19 බොහෝ අයදුම්කරුවන් සැපයුමේ මිල නම්‍යතාවය තීරණය කරන සාධක සාර්ථකව ලියා තිබූ අතර, සමහර අයදුම්කරුවන් සැපයුම තීරණය වීම කෙරෙහි බලපාන සාධක වැරදි සහගත ලෙස ලියා ඇත.

**1.20** බොහෝ අයදුම්කරුවන් ආර්ථික සංවර්ධනයේ ගුණාත්මක වෙනස්කම් වන සේවා වියුක්තිය අඩුවීම, ජීවන තත්ත්වය උසස් වීම, සාධාරණ ආදායම් ව්‍යාප්තිය යනාදි ලෙස සඳහන් කර තිබුණද සමහර අයදුම්කරුවන් ප්‍රමාණාත්මක වෙනස්කම් ද වරදවා නිෂ්පාදනයේ වැඩිවීම ලෙස සඳහන් කර තිබුණි.

## B කොටස

(එක් කොටසකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 කි.)

### ප්‍රශ්න අංක 02

**(a)** නිෂ්පාදන සාධක 4 භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය ලෙස අයදුම්කරුවන් වැඩි දෙනෙක්ම ඉතා සාර්ථක ලෙස ලියා මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගන්නා ලදි.

**(b)** ආර්ථික නොවන භාණ්ඩ සම්බන්ධයෙන් සම්පත් වල විකල්ප ප්‍රයෝජන නොමැතිවිට සේවා වියුක්ත සම්පත් පවතින විට ආවස්ථික පිරිවැය ශූන්‍ය වන බව අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා මුළු ලකුණු ප්‍රමාණයම ලබාගෙන තිබුණි.

**(c)** බොහෝ අයදුම්කරුවන් මූලිකව ආර්ථික ප්‍රශ්න 3 ලියා ලකුණු 3 ලබා ගැනීමට සමත් වුවද ඒවා පැහැදිලි කිරීමට අමතක කර තිබූ නිසා ලකුණු 3 ක් ලබා ගැනීමට අසමත් වන ලදි.

### ප්‍රශ්න අංක 03

**(a)** වෙළඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය බොහෝ අයදුම්කරුවන් නිවැරදිව ගණනය කර මුළු ලකුණු ප්‍රමාණය වන ලකුණු 3 ම ලබාගන්නා ලදි. අයදුම්කරුවන් අතලොස්සක් ගණිතමය සුළු කිරීම්වල වැරදි නිසා අවසාන පිළිතුර ලබා නොගෙන තිබුණි.

**(b)** **(i)** සිසුන්ගෙන් වැඩි පිරිසක් සාමාන්‍ය නිෂ්පාදනය ආන්තික නිෂ්පාදනය නිවැරදිව ගණනය කර තිබුණි.

**(ii)** අයදුම්කරුවන් වැඩි දෙනෙක් මුළු නිෂ්පාදනය සාමාන්‍ය නිෂ්පාදිතය හා අන්තික නිෂ්පාදනය අතර අන්තර් සම්බන්ධයේ පැහැදිලිව ඉදිරිපත් කිරීමට අසමත් විය. සමහර අයදුම්කරුවන් රූප සටහන් මගින් ද මේවා අතර අන්තර් සම්බන්ධය නිවැරදිව ඉදිරිපත් කරන ලදී. සමහර අයදුම්කරුවන් රූප සටහන් මගින් ඉදිරිපත් කළද, ඒවා අතර සම්බන්ධයන් නිවැරදිව ඉදිරිපත් කිරීමට අසමත් වී ඇත. අයදුම්කරුවන්ට මේ පිළිබඳ වැඩිපුර දැනුම ලබා දිය යුතුය.

## ප්‍රශ්න අංක **04**

**(a)** මුදල් ඉල්ලුමට බලපාන සාධක අයදුම්කරුවන් වැඩි දෙනෙක් නිවැරදිව ඉදිරිපත් කළද, සමහර අයදුම්කරුවන් වැරදි අවබෝධයකින්, මුදලට ඉල්ලුමක් ඇතිවන්නේ ඇයි නැතහොත් ද්‍රවශීලතාවයට හේතු ලෙස ගනුදෙනු, ආරක්ෂණ හා සම්පේක්ෂණය ලෙස පිළිතුරු සපයා ලකුණු අහිමිකරගෙන තිබුණි.

**(b)** මිල මට්ටමට හා පොළි අනුපාතය අතර පවතින ධන නැතහොත් අනුලෝම සම්බන්ධය පිළිබඳව අයදුම්කරුවන්ට නිවැරදි අවබෝධයක් නොමැත. බොහෝ අයදුම්කරුවන් මිල මට්ටම හා පොලී අනුපාතය අතර අනුලෝම මෙන්ම ප්‍රතිලෝම යන සම්බන්ධතා දෙකම පවතින බව වැරදි අවබෝධයකින් යුතුව පවසා ඇත. අයදුම්කරුවන්ගේ දැනුම මිල මට්ටම හා පොලී අනුපාතය අතර නිවැරදි කළ යුතු බව හැඟේ.

**(c)** උද්ධමනයට හේතු ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය හා පිරිවැයෙන් තල්ලුවුන උද්ධමනය ලෙස ඉදිරිපත් කළද, ඒවා පැහැදිලි කිරීමට සමහර අයදුම්කරුවන් අමතක කිරීම නිසා අඩු ලකුණු ලබාගෙන තිබුණි.

## ප්‍රශ්න අංක **05**

**(a)** ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කරන ලද වෙළඳ සම්බාධකවල බලපෑම පිළිබඳව අයදුම්කරුවන් බොහොමයකගේ දැනුම ඉතා මඳ බව පෙනේ. මේ පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම වැඩි කළ යුතුය. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද පැහැදිලි කිරීම් ද ඉතා අල්ප වේ.

**(b)** සමහර අයදුම්කරුවන් ක්ෂයවීම් යන වචනයේ නිවැරදි අදහස අවබෝධයකින් තොරව ලියා ඇත. සංකල්පය නිවැරදිව අවබෝධ කරගත් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා මුළු ලකුණු ලබා ගන්නා ලදී.

**(c)** බොහෝ අයදුම්කරුවන් අපේක්ෂ වාසිය, එක් එක් භාණ්ඩය සම්බන්ධයෙන් එක් එක් රටෙහි වෙන වෙනම නිවැරදි ලෙස ගණනය කර, අඩු ආවස්ථික පිරිවැයක් ඇති රට ඒ ඒ භාණ්ඩයේ නිපදවිය යුතු බවට නිවැරදි ලෙස නිගමනය කර, මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට සමත් වුනි.

එහෙත් සමහර අයදුම්කරුවන් ආවස්ථික පිරිවැය ගණනය කිරීමේදී, නිවැරදි දත්ත තෝරා ගැනීමට අසමත් වී ලැබුණු වැරදි පිළිතුර ඔස්සේ වැරදි නිගමනවලට එළඹී ඇත. මින් හැඟී යන්නේ සමහර අයදුම්කරුවන් සාපේක්ෂ වාසිය ගණනය කර අඩු ආවස්ථික පිරිවැයක් ඇති රට එම භාණ්ඩය නිපදවිය යුතු බවට නිගමනය කිරීමට අසමත් වී ඇත.

## <u>C කොටස</u>

**ප්‍රශ්න අංක 06**

**(A)** **(a)** ජාතික ආදායම් ගිණුම්වල පවතින අඩුපාඩු/සීමාවන් බොහෝ අයදුම්කරුවන් සාර්ථකව හඳුනාගෙන සඳහන් කර තිබුණි.

**(b)** "ගැනුම්කරුවන්ගේ මිල" යන්න විෂය කරුණු හොඳින් පරිශීලනය කල අයදුම්කරුවන් මනා ලෙස පිළිතුරු සපයා ඇති අතර, සමහර අයදුම්කරුවන් වචනයේ අර්ථය ලෙස ගෙන පිළිතුරු සපයා තිබුණි. එම පිළිතුරු ලකුණු ලබාදීමට නුසුදුසු තත්වයේ පැවතුණි.

**(B)** **(a)** බොහෝමයක් අයදුම්කරුවන් දළ දේශීය වියදම නිවැරදිව ගණනය කර තිබුණි.

**(b)** අයදුම්කරුවන් වැඩි දෙනෙක්, දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමට, දළ දේශීය වියදමට, භාණ්ඩ හා සේවා අපනයන එකතුකොට, ආනයන අඩුකොට, ශුද්ධ අපනයන, දළ දේශීය වියදමට, ගැලපීමෙන් දළ දේශීය නිෂ්පාදනය නිවැරදිව ගණනය කර තිබුණි, ස්වල්ප අයදුම්කරුවන් පිරිසක් වැරදි සහගත ලෙස ආනයන එකතුකොට අපනයනය අඩුකොට තිබුණි. තවත් සමහර අයදුම්කරුවන් සුළු පිරිසක්, ශුද්ධ අපනයතය ඒකතු කරනවා වෙනුවට අඩුකර තිබුණි.

**(c)** **(a)** හා **(b) කොටස්වලට** නිවැරදි පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ට **(c) කොටසේ** නිවැරදි පිළිතුර ලබාගැනිමට පහසුවිය.

එනම් වෙළෙඳපොළ මිලට, දළ දේශිය නිශ්පාදිතයට විදේශ ශුද්ධ ප්‍රාථමික අදායම ගැලපීමෙන් වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම ලැබේ. ප්‍රායෝගිකව විදේශ ශුද්ධ ආදායම ඍණ අගයක් ගන්නා නිසා මෙම අභ්‍යාසයේ විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම ධන අගයක් ලෙස දී තිබුණද අයදුම්කරුවන් වැරදි සහගත ලෙස අඩුකර ඇත. මේ පිළිබඳව අයදුම්කරුවන්ට නිවැරදිව ගැලපිය යුතු ආකාරය අවබෝධ කරගත යුතුය.

**(C)** රජය මෑත කාලයේදි කරන ලද බදු පැනවීම්, ශ්‍රී ලංකාවේ පුද්ගලයින්ට හා ව්‍යාපාරවලට බලපාන ආකාරය අයදුම්කරුවන් නිවැරදිව සඳහන් කර තිබුණි. එහෙත් බොහෝ අයදුම්කරුවන් එම ආකාර දෙක පැහැදැලි කිරිම සාර්ථකව සිදුකර නොතිබුණි.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනිමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

(1) විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරිම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති උත්තර පිළිබඳව නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම්/විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථනවලට අනුකූලවෙමින් උත්තර ලියන්න.

(4) මෙම විෂයට අදාළ ස්ව-අධ්‍යයන පාඩම් මාලාව, ග්‍රන්ථ, අත්පොත් ලිපි, සඟරා, මහ බැංකු වාර්තා ආදිය මැනවින් පරිශිලනය කිරීම.

(5) උත්තර ලිවිමේදි මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදිමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න හා උත්තර පරිශිලනය කිරිමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනිම තුලින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර බාරදිමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසි පරිදි යොදා තිබේදැයි නැවත පරික්ෂා කර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත්වීම.

- * * * -